# ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය

---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර, 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය පතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

----------------------------------------

1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

ආදායම් හා පොලී ආදායම උපචිත සංකල්පයෙන් බැහැරව ගිණුම්ගත කර තිබුණි. තවද ගිණුම් පිළියෙල කිරීමේදී ඒකාකාර සංකල්පය අනුගමනය කර නොතිබුණි.

1.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

-----------------------------------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුව ශේෂ පත්‍ර දිනට වත්කමක සාධාරණ අගය එදිනට එම වත්කමෙහි ධාරණ අගය හා ප්‍රමාණාත්මක අයුරින් වෙනස් නොවන බව තහවුරු වන පරිදි ප්‍රමාණවත් කාල පරතරයන්හිදී ප්‍රත්‍යාගණනයන් සිදුකළ යුතු වුවද ශේෂ පත්‍ර අගය ශූන්‍ය ලෙස පෙන්වා තිබෙන එහෙත් ආයතනයේ මෙහෙයුම් කාර්යයන් සඳහා ඵලදායීව භාවිතා කරනු ලබන දේපළ පිරියත උපකරණ ආදිය ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. උදාහරණ කීහිපයක් පහත දැක්වේ.

රු.4,244,850 කට මිලට ගන්නා ලද වාහන 6ක් ද , රු. 2,418,785 ක් වටිනා ජායා පිටපත් කිරීමේ යන්ත්‍රද , රු.937,755 ක් වටිනා වානේ කබඩ් හා රු.3,584,734 ක් වටිනා කාර්යාල උපකරණද මේ අතර විය.

1.2.3 ගිණුම්වලින් අත්හැරීම්

------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.5 වගන්තියේ විධිවිධාන අනුව අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා සපයා තිබෙන විශ්ව විද්‍යාලයට අයත් නිල නිවාස වල හවුලේ පදිංචිව සිටින නිලධාරීන්ගෙන් නිවාස කුලී වශයෙන් වැටුපෙන් 5% ක මුදලක් අයකල යුතු වුවද, එම විධිවිධාන වලට පටහැනිව විශ්ව විද්‍යාලයේ කාර්ය මණ්ඩල නේවාසික කමිටුව විසින් තීරණය කල ක්‍රමයකට කුලී ගණනය කර අයකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විශ්ව විද්‍යාලයට ලැබිය යුතුව තිබූ රු. 8,047,170 ක ගෙවල් කුලී අයකර ගෙන නොතිබුණි.

1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සඟරා සඳහා ලබා දුන් අත්තිකාරම් පියවනු ලබන්නේ සඟරා කලාප පුස්තකාලයට ලැබීමෙන් අනතුරුව වුවත් 1999 සිට 2009 දෙසැම්බර් මස 31 දක්වා සඟරා මිලදී ගැනීම සඳහා නිකුත් කර තිබූ රු.1,368,211 ක අත්තිකාරම් මුදල් 2010 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

(ආ) 2005 වර්ෂයට පෙර සිට පැවත එන රු. 21,013 ක සැපයුම් ණයහිමි ශේෂය සමාලෝචිත වර්ෂයේදීද පියවා නොතිබුණි.

(ඇ) නිලධාරීන් 04 දෙනෙකුට ලබා දී තිබු රු.552,030 ක ආපදා ණය ශේෂය හා නිලධාරීන් 02 දෙනෙකුට ලබාදී තිබූ රු.31,500 ක පරිඝණක ණය ශේෂය අය නොවන ණය ශේෂ ලෙස නිරීක්ෂණය වු අතර, නිලධාරීන් 02 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ රු. 106,000 ක වාහන ණය ශේෂය සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-----------------------------------

වටිනාකම රු.113,150,248 ක් වූ ඉඩම්වලට අදාල සින්නක්කර ඔප්පු හා වටිනාකම රු.8,266,742 ක් වූ ජල සැපයුම් යෝජනා ක්‍රමයේ වත්කම්වලට අදාල උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.2.6 නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) පනත් | |
| 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ XIII පරිච්ඡේදයේ 99(ඇ) වගන්තිය | කවර හෝ ප්‍රභවයකින් උපයා ගනු ලබන සියලුම ආදායම් විශ්ව විද්‍යාල අරමුදලට බැරවිය යුතු වුවත්, එම නියමයෙන් බැහැරව පාඨමාලා 05ක් සහ ව්‍යාපෘතියක් යටතේ ලද රු.19,306,246 ක මුදල් විශ්ව විද්‍යාල අරමුදලට බැරකර නොතිබුණි. |
| (ආ) චක්‍රලේඛ | |
| (i) 2009 අප්‍රේල් 26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 | සියලුම සේවකයින් පැමිණීම හා පිටවීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු වුවත්, විශ්ව විද්‍යාලය ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. |
| (ii) 2008 ජුලි 28 දිනැති පී.ඊ.ඩී 50 රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය | ඉන්ධන දීමනා ලබාගන්නා නිලධාරීන් විසින් අතිරේක ගමන් සඳහා සංචිත වාහන යොදවා ගැනීම සඳහා ආයතන ප්‍රධානියාගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව, සංචිත වාහනයක් යොදවාගෙන කි.මී. 1285 ක දුරක් ධාවනය කර තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (මු.රෙ) | |
| (i) මු.රෙ 371 (2) | අතුරු අග්‍රිමයන් දෙන ලද කාර්යයන් නිම වූ විගසම පියවිය යුතු වුවද, අවස්ථා 85 කදී ලබාගන්නා ලද රු. 1,214,072 ක සේවා අත්තිකාරම් මුදල් සහ රු. 4,119,363 ක කොන්ත්‍රාත් අත්තිකාරම් මුදල් 2010 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. |
| (ii) මු.රෙ 371 (2) (ආ) | අතුරු අග්‍රිමයක් වශයෙන් එක් අවසථාවකදී ලබා දිය හැකි උපරිම මුදල රු. 20,000 ක් වුවද එම සීමාව ඉක්මවා අවස්ථා 10 කදී රු. 722,900 ක් අත්තිකාරම් වශයෙන් ලබා දී තිබුණි. |

| | |
|---|---|
| (iii)මු.රෙ 571(2) | තැන්පත් කළ දින සිට වර්ෂ දෙකක් ඉක්මවන ලද රු. 3,583,124 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (iv)මු.රෙ. 756 | වටිනාකම රු.82,853,801 ක් වූ පුස්තකාල පොත් හා වටිනාකම රු.1,037,450,869 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 04 කට අදාලව වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (v) මු.රෙ 1646 | වාහන 04 ක් හැර අනෙකුත් වාහන වලට අදාල 2010 වර්ෂයේ මාසික ධාවන සටහන් සහ මාසික සාරාංශවල පිටපත් 2011 ජුනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

1.2.7 අධිකාර් බලයෙන් තොර ගනුදෙනු

ක්‍රීඩා පිටිය වටා පැති බැම්ම ඉදිකිරීමේ කර්මාන්තයේ මුළු ඇස්තමේන්තු වටිනාකම රු. 7,523,275 ක් වු අතර, එය මිලියන 5 ක සීමාව ඉක්මවන බැවින් අදියර i හා ii වශයෙන් වෙන්කොට දෙපාර්තමේන්තු මට්ටමින් අනුමැතිය ලබා දීමට කටයුතු කර තිබුණි.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය සමාලෝචනය

2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශණ අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.419,030,000 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.371,446,000 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණ රු.327,535,000 ක ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.91,495,000 ක් දක්වා අඩු වී තිබූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දී පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණ රු.300,645,000 ක ප්‍රදානය ගැලපූ පසුව එම වර්ෂය සඳහා වූ ඌණතාවය රු.70,801,000 ක් දක්වා අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ඌණතාවය වැඩිවීමට පෞද්ගලික පඩිනඩි වියදම රු.20,763,000 කින් හා ක්ෂය කිරීම් රු.28,820,000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.2 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

2.2.1 කළමණාකරණ දුර්වලතා

-------------------------

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩල නේවාසිකාගාරවල, ගිවිසුම් ගත කාලය අවසන් වුවද, ඒ සඳහා නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ප්‍රසම්පාදන කමිටු ආවරණ අනුමැතියට යටත්ව නේවාසිකාගාර බදු කාලය මාස 03කින් දීර්ඝ කල බව උපකුලපතිවරයා විසින් විගණනයට දැනුම් දී තිබුණි.

(ආ) රු. 1,657,667 ක පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා නොගෙන ගෙවීම් කර තිබු අතර, එයින් රු. 768,154 ක මිලදී ගැනීම් සඳහා උපකුලපති අනුමැතිය පමණක් ලබා ගෙන තිබුණි.

(ඇ) 2007 වර්ෂයේ ගිවිසුම් ප්‍රකාර එම වර්ෂයේදීම වැඩ නිම කළ යුතු රු. 10,577,626 ක් වටිනා කොන්ත්‍රාත් 07ක වැඩ නිමවා නොමැති බැවින්, කාර්ය සාධන බැදුම්කරයෙන් අදාල මුදල් අයකර ගෙන නොතිබු අතර, ගිවිසුම් උල්ලංඝණය කිරීම පිළිබඳව නීතමය ක්‍රියාමාර්ගද ගෙන නොතිබුණි.

2.2.2 ක්‍රියාකාර් සැලැස්මට අනුව කටයුතු කිරීම.

-------------------------------------------

විගණනයට ඉදිරිපත් වු 2010 වර්ෂයට අදාල ක්‍රියාකාර් සැලැස්මට අනුව, ඉටු කිරීමට සැලසුම් කර තිබු පහත සඳහන් වැඩ විෂයයන් නිමකර නොතිබු අතර, ප්‍රසම්පාදන කාලසටහනට අනුව කටයුතු කර නොතිබුණි.

| වැඩ විෂයය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය | පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ශේෂය | 2010 වර්ෂයට ලැබුණු ප්‍රතිපාදන | මුළු ප්‍රතිපාදන | 2010 වර්ෂයේ තථ්‍ය වියදම | 2010.12.31 දිනට වියදම් නොකර ඉතිරි මුදල් | ඉතිරි මුදල මුළු ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | % |
| පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම | 10,000,000 | 590,705 | 6,000,000 | 6,590,705 | - | 6,590,705 | 100.00 |
| ලී බඩු සහ කාර්යාල උපකරණ | 32,750,000 | 50,626 | 31,000,000 | 31,050,626 | 21,328,125 | 9,722,501 | 31.31 |
| පොත් හා ප්‍රකාශණ | 10,000,000 | 2,993,701 | 7,000,000 | 9,993,701 | 5,034,600 | 4,959,101 | 49.62 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රියාකාර සැලැස්මට අනුව 2010 වර්ෂයේදී පර්පාලන ගොඩනැගිල්ල ඉදිකිර්ම සඳහා ලැබුණු මුදලින් කිසිම ඉදිකිර්මක් කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේදී ලී බඩු හා කාර්යාල උපකරණ සඳහා රු. 32,750,000 ක ප්‍රතිපාදනයක් වෙන් කර, එයින් රු. 31,000,000 ක මුදලක් ලබා ගෙන, භාණ්ඩ මිලදී ගෙන තිබුණේ රු. 21,328,125 කට පමණි. ඉතිර් රු.9,722,501 ක මුදල ක්‍රියාකාර සැලසුමට අනුව අවශ්‍ය අරමුණ සඳහා වැය නොකර, මුදල් ඉදිරි වර්ෂය සඳහා ගෙන යන බව උපකුලපති විසින් විගණනයට වාර්තා කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී පොත් හා ප්‍රකාශන මිලදී ගැනීම සඳහා සැලසුම් කර එයින් රු. 7,000,000 ක මුදලක් භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණත්, වියදම් කර තිබුණේ රු.5,034,600 ක මුදලක් පමණි.

2.2.3 හඳුනා ගන්නා ලද පාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ලබා ගත යුතු වට්ටම් ලබා නොගැනීම හේතුවෙන් ආයතනයට සිදු වු පාඩුව රු. 410,536 ක් විය.

(ආ) අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ලබාගත් නේවාසිකාගාර සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලද වාර්තා අනුව වාර්ෂික තක්සේරුවක් වෙනුවට මාසික තක්සේරුවක් ලබා ගැනීමෙන් විශ්ව විද්‍යාලයට සිදු වු පාඩව රු. 60,000 ක් වී තිබුණි.

2.2.4 අනාර්ථික ගනුදෙනු

-----------------------

කුලියාපිටිය පර්ශ්‍රයේ ශිෂ්‍ය නේවාසිකාගාර 04 ක් කුලියට ගැනීමේදී පමණක් තක්සේරු වටිනාකම රු.963,000 කින් ඉක්මවා තිබුණත්, පාලක සභාවේ අවසර ලැබ ඒ සඳහා ගෙවීම් කළ බව උපකුලපති විසින් විගණනයට වාර්තා කර තිබුණ අතර, නේවාසිකාගාර හිමිකරුවන් සමඟ ඇතිකරගත් ගිවිසුම්වල කොන්දේසි ඉක්මවා, රැකබලා ගැනීම, පිරිසිදු කිර්ම හා ආරක්ෂා කිර්ම වෙනුවෙන් තවත් රු.855,000 ක් ගෙවා තිබුණි.

2.2.5 නිශ්කාර්ය වියදම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 517,828ක වියදමින් මාකදුර පරිශ්‍රයේ ඉදිකරන ලද විවෘත වෙස් ක්‍රීඩා පිටිය 2008 වර්ෂයේ සිට 2011 ජූනි දක්වා ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුනි.

(ආ) රු. 630,071 ක වියදමින් මාකදුර පරිශ්‍රයේ පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ අවශ්‍යතාවය සඳහා 2009 වර්ෂයේදී ඉදිකරන ලද සත්ත්ව පාලන ඒකකය - පළමු අදියර 2010 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

2.2.6 පශ්චාත් උපාධි පාඨමාලාව පැවැත්වීම

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පශ්චාත් උපාධි පාඨමාලාව වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන කුලියාපිටිය ලංකා බැංකු ජංගම ගිණුමේ 2007 දෙසැම්බර් සිට හඳුනා නොගත් තැන්පතු ලෙස රු.259,500 ක් 2010 දෙසැම්බර් මාසය දක්වා බැංකු සැසඳුම්වල දක්වා තිබුණි.

(ආ) විශ්ව විද්‍යාලයෙන් බාහිර ස්ථානයක විවිධ වැඩමුළු පැවැත්වීම වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් මුදල් ලබාගෙන දිවා ආහාර හා තේ වියදම් වෙනුවෙන් රු.136,000 ක් වියදම් කර තිබුණ අතර, ඒ සඳහා අදාල බිල්පත් ඉදිරිපත් කර නොතිබුණි.

2.2.7 ඒක ශිෂ්‍ය පිරිවැය

-------------------

(අ) 2010 වර්ෂයේ එක් එක් පීඨයන් සඳහා දරා ඇති වියදම සහ ශිෂ්‍යයින් පිළිබඳ වූ තොරතුරු පහත දැක්වේ.

| | | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | වැව්ලි කළමනාකරණ පීඨය | පශු ධීවර පෝෂණ පීඨය |
|---|---|---|---|---|---|
| 2010 වර්ෂයේ වියදම | රු. | 36,210,522 | 44,409,963 | 47,493,277 | 45,811,647 |
| ශිෂ්‍ය සංඛ්‍යාව | | 980 | 407 | 363 | 283 |
| ඒක ශිෂ්‍ය පිරිවැය | රු. | 36,950 | 109,115 | 130,835 | 161,878 |

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) 2010 වර්ෂය තුළ පශු, ධීවර පෝෂණ පීඨය හා වැව්ලි කළමණාකරණ පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව බැලීමේදී ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි.

(ii) මාකඳුර පරිශ්‍රයේ ඇති පීඨ දෙක සඳහා තෝරාගත් ශිෂ්‍යයින්ගෙන් බොහෝ සංඛ්‍යාවක් වෙනත් විශ්ව විද්‍යාලවලට මාරුවීයාමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | වෙනත් විශ්ව විද්‍යාල සඳහා මාරුවී ගිය ශිෂ්‍ය සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| පශු ධීවර පෝෂණ | 2007 | 63 | 30 | 47.61 |
| විද්‍යා පීඨය | 2008 | 62 | 16 | 25.80 |
| | 2009 | 88 | 19 | 21.59 |
| | 2010 | 143 | 38 | 26.57 |
| වැව්ලි | 2007 | 94 | 14 | 14.89 |
| කළමණාකරණ | 2008 | 111 | 24 | 21.62 |
| පීඨය | 2009 | 131 | 32 | 24.42 |
| | 2010 | 156 | 37 | 23.71 |

(ආ) ශිෂ්‍ය බඳවා ගැනීම

---------------------

කෘෂිකර්ම හා වැවිලි කලමණාකරණ, පෝෂණ, පශු සම්පත් ධීවර හා ගෙවතු යන පීඨයන් සඳහා ශිෂ්‍යයින් 63 දෙනක අධ්‍යාපන කටයුතු ආරම්භයේදීම සහභාගී වී නොතිබීම හා ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා ශිෂ්‍යයන් 22 දෙනෙකු සහභාගී නොවීම, උපකුලපති විසින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දන්වා ඇතත්, අදාල පුරප්පාඩු පිරවීම සඳහා ශිෂ්‍යයින් බඳවා ගැනීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කටයුතු නොකිරීම හේතුවෙන් අනුමත ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් අධ්‍යයන කටයුතු වල යෙදී තිබුණි.

2.2.8 අයවැය පාලනය

-------------------

වාර්ෂික අයවැය ලේඛණය ඵලදායී මූල්‍ය කලමණාකරණ පාලන කාරකයක් ලෙස භාවිතාකර නොතිබුණ බව පහත සඳහන් අවස්ථා අනුව නිරීක්ෂණය විය.

(අ) විෂයයන් 31 ක් සඳහා අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි.
(ආ) විෂයයන් 13 ක අයවැය ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි.
(ඇ) විෂයයන් 04 ක මුළු ප්‍රතිපාදන මුදලම වියදම් කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

--------------------

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයෙදී නිරීක්ෂණය වූ අඩුපාඩු විගණන විමසුම් මගින් උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුව ඇත.

(අ) පුස්තකාල පොත් මිලදී ගැනීම
(ආ) ඉදිකිරීම් කොන්ත්‍රාත්
(ඇ) ගිණුම්කරණය
(ඈ) අත්තිකාරම්
(ඉ) බාහිර පාඨමාලා
(ඊ) තොග පාලනය
(උ) සේවක මණ්ඩල
(ඌ) අයවැය
(එ) ප්‍රසම්පාදන